**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
பொலிஸ் ஊடகப் பிரிவு
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.08 පැය 1405 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/683 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීම - සීදූව පොලිස් වසම.**

2025.04.08 වන අද දින උදෑසන කාලයේ සීදූව පොලිස් වසමේ කොළඹ - මීගමුව මාගර්යේ ලියනගේමුල්ල ප්‍රදේශයේ දී වෙළෙඳ සැලක සිටි පුද්ගලයෙකුට වෙඩි තැබීමක් සිදු ව ඇති බවට සීදූව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් අනුව විමශර්න ආරම්භ කර ඇත.

**තුවාලකරු මීගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත. මරණකරු වයස අවුරුදු 51 ක් වූ ලියනගේමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මරණකරු තමා විසින් පවත්වාගෙන යනු ලබන මහන යන්ත්‍ර උපාංග අලෙවිසැලේ සිටියදී වෙළඳසැල තුළට ඇතුළු වූ පුද්ගලයෙකු විසින් මෙම වෙඩි තැබීම සිදු කර පලා ගොස් ඇති අතර සැකකරුවන් පැමිණි ආකාරය හා සැකකරුවන් සම්බන්ධයෙන් මෙතෙක් තොරතුරු අනාවරණය වී නොමැත

මෘතශරිරය මීගමුව රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා සීදූව පොලිසිය වැඩිදුර විමශර්න පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**